මගේ අංකය: 543 ඊ 389 ඩී

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 105

~~ආයතන මාලා අංක: 74.~~

රාජ්‍ය පරිපාලන ~~හා ස්වදේශ කටයුතු පිළිබඳ~~ ~~අමාත්‍යාංශය,~~
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1976 මාර්තු මස 23 දින.

සියළුම ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් තත්ත්වය යළි පිරිනැමීම.

අංක 42 හා 1971 දෙසැම්බර් 24 වැනි දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 1972 ජනවාරි මස 1 වෙනි දින හෝ එදිනට පසුව හෝ මාසික වැටුප් ~~ලබන~~ තනතුරුවලට පත් කරනු ලැබූ සියළුම රජයේ සේවකයෝ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකවීමට නියමව සිටියහ. ඉහත සඳහන් චක්‍රලේඛය නිකුත් නොකරනු ලැබුවේ නම් විශ්‍රාම වැටුප් පදනමක් මත පත්වීම් ලැබීමට නියමිතව සිටියාවූ අයට අතීතයේ සිට වලංගුවනසේ විශ්‍රාම වැටුප් තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා රජය තීරණය කර තිබේ. මෙම තීරණය පෙරදැරි කොට ගෙන අනුගමනය කළයුතු උපදෙස් පහත දැක්වේ,:-

(I) 1 වැනි සහ ඊට පහළ පන්තිවලට අයත් කම්කරු ශ්‍රේණිවල නියුක්ත සේවකයින් හැර 1971 දෙසැම්බර් මස 1 වැනි දිනට විශ්‍රාම වැටුප් හිමි හෝ ඉන් අනතුරු දිනක විශ්‍රාම වැටුප් සහිතයයි ප්‍රකාශ කරන ලද හෝ තනතුරුවලට 1972 ජනවාරි මස 1 වැනි දින හෝ එදිනට පසුව ස්ථිර පදනමක් මත පත් කරනු ලැබූ රාජ්‍ය සේවකයෝ, එසේ පත් කරන ලද දින සිට විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබිය යුත්තාහ.

(II) 1972 ජනවාරි මස 1 වැනි දින හෝ එදිනට පසුව රජයේ සේවාවට පත්කරනු ලැබූ 1 වැනි සහ ඊට පහළ පන්තිවලට අයත් කම්කරු ශ්‍රේණිවල නියුක්ත සේවකයෝ අනුමත සේවක සංඛ්‍යාවෙහි ස්ථිර තනතුරු උසුලන්නෝ නම් අවුරුදු 10 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් තත්ත්වය ලැබිය යුත්තාහ.

(III) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරියන් හැර 1972 ජනවාරි මස 1 වැනි දින හෝ එදිනට පසුව ස්ථිර පදනමක් මත විශ්‍රාම වැටුප් හිමි තනතුරුවලට පත් කරනු ලැබූ සේවිකාවෝ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට තවදුරටත් දායක විය යුත්තාහ. ඔවුන් පත්වීම ලැබීමෙන් අවුරුදු 10 ක් ඇතුළත තමන් විශ්‍රාම වැටුප් තත්ත්වයකට පත් කරනු ලැබිය යුතු ද නැතහොත් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවමින් විශ්‍රාම වැටුප් රහිත තත්ත්වයේ රැඳී සිටින්නේ ද යන්න ගැන සිය විකල්පය පළකල යුතුය.

2 වැනි පිටුවට.....

සම් සේවිකාවක් නියමිත කාල පරිච්ඡේදය තුළ තමාගේ අභිමතය පල කිරීමට අසමත්වී නම්, ඇය විශ්‍රාම වැටුප් රහිත තත්ත්වයේ රැඳී සිටීමට ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයෙකුවීමට ද කැමැත්ත පළකර ඇත්තාසේ සැලකෙනු ඇත.

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියුක්ත ගුරුවරියෝ ස්ථිර පදනමක් මත විශ්‍රාම වැටුප් හිමි තනතුරුවලට පත් කරනු ලැබූ දින සිට විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබිය යුත්තාහ.

2. පූර්ව පරිච්ඡේදයෙහි සඳහන් කරන ලද සේවකයන් වෙතින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් අයකර ගැනීම 1976 අප්‍රේල් මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් විය යුතු අතර, සේවයෙහි නියුතු පිරිමි පක්ෂය වෙතින් වැ.අ. විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අයකර ගැනීම, එම දින සිට අංක 96 හා 1975 ජූලි මස 9 වැනි දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 වැනි ඡේදයේ නියමයන් පරිදි ආරම්භ විය යුතු වේ.

3. පහත දැක්වෙන කරුණු ගැන උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.:-

(අ) එක් එක් සේවකයා වෙත විශ්‍රාම වැටුප් පදනමක් මත පත්වීම් ලිපි නිකුත් කිරීම;

(ආ) 1976 අප්‍රේල් 1 වැනි දිනට පෙර කාලය සඳහා ලැබිය යුතු වැ.අ. දායක මුදල් අයකර ගැනීම;

සහ

(ඇ) 1976 මාර්තු මස 31 වැනි දින අක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවන ලද දායක මුදල් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ගය;

4. මෙම චක්‍රලේඛය එය නිකුත්වීමේ දිනට කලින් රාජ්‍ය සේවයේ නොසිටි රාජ්‍ය සේවකයින් වෙනුවෙන් අදාල නොවේ.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ලේකම්.